*සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது*
*All Rights Reserved*

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
## அரசகரும மொழிகள் திணைக்களம்
# Department of Official Languages

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) , (දෙමළ/ඉංග්‍රීසි) , (සිංහල/දෙමළ) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2016**

**அரசகரும மொழிகள் திணைக்களத்தின் மொழிபெயர்ப்பாளர் (சிங்களம்/ஆங்கிலம்), (தமிழ்/ஆங்கிலம்), (சிங்களம்/தமிழ்) பதவிகளுக்கு ஆட்சேர்ப்பு செய்வதற்கான திறந்த / மட்டுப்படுத்தப்பட்ட போட்டிப் பரீட்சை - 2016**

**Open/Limited Competitive Examination for Recruitment to the Posts of Translator II (Sinhala/English), (Tamil/English) and (Sinhala/Tamil) in the Department of Official Languages – 2016**

***පරිවර්තනය / மொழிபெயர்ப்பு / /Translation***

*කාලය: පැය 3* — මුළු ලකුණු 100
*நேரம்: 3 மணித்தியாலம்* — மொத்த புள்ளிகள் 100
***Duration: 3 Hours*** — **Total Marks: 100**

*විභාග අංකය*
*சுட்டெண்*
***Index No:……………………………..***

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**
***எல்லா வினாக்களுக்கும் விடையளிக்கவும்***
**Answer all questions**

---

**පහත සඳහන් ඡේද දෙමළ භාෂාවට පරිවර්තනය කරන්න**

**1.** ඉන්ටර්නෙට්' යනු පරිගණක යන්ත්‍ර හාර ලක්ෂයකට අධික සංඛ්‍යාවක් එකට සම්බන්ධ කරන විවෘත ලෝක ව්‍යාප්ත සන්නිවේදන ජාලයකි. අන්තර්ජාලය වැනි සුනම්‍ය හා ප්‍රසාරක පද්ධතියක් කෙසේ බිහිවූයේ දැයි ඔබ සිතනු ඇත. මුලදී එය ආරක්ෂක කටයුතු සඳහා පමණක් භාවිත කරන ලද හමුදා ව්‍යාපෘතියක් විය. අනතුරුව ශාස්ත්‍රීය ආයතන අතර පර්යේෂණවල හුවමාරු කර ගැනීමේ ක්‍රියාදාමයේ පුරුකක් බවට පත් වූ අන්තර්ජාලය ක්‍රමක්‍රමයෙන් ශාස්ත්‍රීය, වානිජ හා පෞද්ගලික භාවිතයන් සඳහා මාධ්‍යයක් ලෙස විකාශය විය. එය තවමත් වැඩෙමින් හා වෙනස් වෙමින් පවතී. අනාගතයේදී එය කෙසේ වර්ධනය වනු ඇතිදැයි අනාවැකි පැවසීම දුෂ්කර කාර්යයක් වේ.

ඉන්ටර්නෙට් ජාලය පාලනය කරන පාරම්පරික අධිකාරයක් නොමැත. ඉන්ටර්නෙට් ජාලයේ අයිතිය, ක්‍රියාකාරීත්වය සහ කළමනාකරණය එය භාවිත කරන්නන් වෙත පැවරී තිබේ. ජාලයේ ගමන් මාර්ගය ගැන අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස ඔවුන්ට ඇත. එහෙත් ඉන්ටර්නෙට් ජාලය උප-ජාල රැසකින් සැදී තිබේ. මෙම උප-ජාල භාරව සිටින හා එහි භාවිතය පිළිබඳ නීති පනවන පුද්ගලයෝ සිටිති. ඒ කෙසේ වෙතත් සමස්ත ඉන්ටර්නෙට් ජාලය පාලනය කිරීමේ අයිතියක් කිසිවෙකුට නොමැත. මේ නිසා ඉන්ටර්නෙට් ජාලය දේශපාලන බලපෑම්වලින් තොර ස්වාධීන පද්ධතියක් බවට පත් වී ඇත. ඇත්ත වශයෙන්ම ඉන්ටර්නෙට් ප්‍රජාව විශ්වාස කරන්නේ ඔවුන් වෙනම ලෝකයක සිටින බවයි. ඉන්ටර්නෙට් ජාලයේ තොරතුරු සෙවීමේ කාර්යය 'සයිබර් අවකාශයට ඇතුළු වීම' යනුවෙන් හැඳින්වීමෙන් මෙම විශ්වාසය පිළිබිඹු වේ.

ඉන්ටර්නෙට් ජාලය හුදෙක් පර්යේෂණ කටයුතුවලට පමණක් නොව විනෝදය සඳහා ද භාවිත කිරීමෙන් ඵලදායිතාවේ ක්ෂය වීමක් ඇති වේදැයි සලකා බැලීම වටී. සමාජ වෙබ් අඩවිවලට ඇබ්බැහි වීම, අන්තර්ජාලයෙන් කාමෝද්දීපන නිර්මාණ ලබා ගැනීමට හැකි වීම යනාදිය හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න මතු වී තිබේ. තවද ඉන්ටර්නෙට් ජාලයේ වර්තමාන ආකෘතිය යටතේ ඒවා විශෝධනය කිරීම අසීරු කාර්යයකි. ඉන්ටර්නෙට් ජාලයට අයිතිකරුවකු නොමැති බැවින් විශෝධන ප්‍රයත්නය බෝම්බ හෙළීමක් බඳු ආක්‍රමණයක් ලෙස සැලකෙනු ඇත.

**(ලකුණු 35)**

**02. පුවත්පත් නිවේදනය**

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබයි.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2017 ජනවාරි 11 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ දී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹිණ. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශන සහ නඩු පැවරීම් සඳහා අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම මෙහි මූලික පරමාර්ථය වේ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වියානි ගුණතිලක මහතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ එච්. අමරතුංග මහතා විසින් මුදල් විශුද්ධිකරණය (money laundering) සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ඉදිරියේ මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම යනු දේශීය හා ජාත්‍යන්තර වශයෙන් එකිනෙකට සම්බන්ධ වන මූල්‍ය අපරාධ වන අතර එමඟින් ගෝලීය ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවට තර්ජනයක් එල්ල වීමේ හැකියාව ඇත. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට සම්බන්ධ සැක කටයුතු පුද්ගලයන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීමට මෙම අවබෝධතා ගිවිසුම උපකාරී වේ.

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මේ වන විටත් ශ්‍රී ලංකා රේගුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ මෙවැනිම අවබෝධතා ගිවිසුම්වලට එළැඹී ඇති අතර අදාළ අනෙකුත් දේශීය රාජ්‍ය ආයතන සමඟ ද ඉතා ඉක්මනින් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.

**(ලකුණු 30)**

**3.** අරවින්දගේ චරිතය කියවීමකින් තොරව විරාගය කියවිය නොහැක. අරවින්දගේ චරිතය තනිකමෙන් පෙළුණු හා තර්ක බුද්ධියේත්, ව්‍යවහාරයේත් සට්ටනයන් හේතුවෙන් ජීවිතය කෙරෙහි දැඩි උදාසීනත්වයක් දැක්වූයෙකු ගැන හෙළි කරයි. විරාගයේ ඇති අනෙක් චරිත අතරින් මේනකා, සරෝජනී, සිරිදාස හා බතී ප්‍රධාන වෙති. අරවින්දගේ චරිතය බොහෝ විට හැඩ ගැසෙන්නේත්, ගලා යන්නේත් ඔවුන් මූලික කොටගෙන ඔවුන් වටාය. සිංහල නවකථා මඟින් බිහි කෙරුණු චරිතයන් අතරින් වැඩිම විවේචනයන්ට හා වැඩිම දෝෂාරෝපනයන්ට ලක්වූ චරිතයක් වේ නම් ඒ විරාගයේ 'අරවින්ද' යි.

“කයින් වෙනස් වීමට වෑයම් කළ මගේ රාගය විරාගයට ළං විය. එය රාගය බව දැනගත් සමාජය මා කුහකයකු කොට සැලකූහ.” (48 පිටුව)

“ලෝකයටත් ගතානුගතික සිරිත් විරිත්වලටත් සිතින් අවඥා කිරීමෙන් මම සන්තෝෂයක් ලැබුවෙමි. .... එහෙත් නිශ්චයකට බැස ක්‍රියාකිරීමට මම අසමත් වීමි.” (121 පිටුව)

“සරාගේ යෝජනාව පරිදි අප දෙදෙනා පිට පළාතකට ගොස් අඹු සැමියන් මෙන් ජීවත් වීම කලංකයක වන්නේ මට නොව සරාටය. සරාට ඇති ඇල්ම නිසා සරා එවැනි අපකීර්තියකට භාජන කිරීමට මම නොකැමැත්තෙමි.” (131 පිටුව)

“සරෝජනී නිසා මා තුළ හටගත් ආදරය මගේ හද දැඩි කොට නොපෙළා ක්‍රමයෙන් අතුරුදහන් විය.” (140 පිටුව)

“මා මැදිවියට ළංවූවකු වුවද බතී ගැන සිතුවේ මුග්ධයකු ලෙසය.” (200 පිටුව)

“එය හුදෙකලාව ජීවත්වන මගේ හද ටිකින් ටික විනාශ කරන විෂ බේතක් වැන්න.” (231 පිටුව)

තමන්ගේ නිවස සොයුරිය විසින් අත්පත් කර ගනිද්දීත්, තමන් ප්‍රේම කළ තරුණිය අනෙකකු විසින් විවාහ කර ගනිද්දීත් ඔහු ඒ සියල්ල උපේක්ෂාවෙන් ඉවසීය. තම නිවසේ මෙහෙකාරියගේ දියණියට තම වියදමින් උගන්වා පසුව ඇයව විවාහ කරදුන් ඔහු ඊට එරෙහිව වූ සමාජ අපවාදයන් කෙරෙහි නෑසූ කන්ව සිටියේය. අවසානයේ ඒ හේතුවෙන්ම සිතින් හා කයින් දුර්වල අයෙකු විය. නමුත් අවසානයේදී ඔහු මියයන්නේ ඒ හේතුවෙන් ඇතිවූ කළකිරීමෙන් නොවේ. ජීවිතයේ අවසාන භාගයේදී ඔහු මනුෂ්‍යය ජීවිතය සම්බන්ධයෙන් වූ සනාතන සත්‍යයක් සාක්ෂාත් කර ගනියි.

"බතීත් සරෝජනීත් පිළිබඳ මගේ හැඟීම මැරෙන්නට යන පක්ෂියෙකු මෙන් අත්තටු සලතියි මට සමහර විට හැඟේ. නොතින් ආසාව මට දැන් මගේ ශෝකයට නොව සොම්නසට හේතුවෙයි. මගේ ආත්ම විශ්වාසය නැතිවිය. තැණවතීගෙන් සාත්තු ලබමින් මා ජීවත් වූ කාලය මරු කතරක ජීවත්වීමක් ලෙස හැඟේ. මගේ ලෙඩේ සුව නොවේ. එහෙත් කරුණාව, දයාව, ඇල්ම යන ආදී මිනිස් දහමින් නොතොර තැනක ජීවත්වීම නිසා මගේ කළකිරීම දුරු විය.

**(ලකුණු 35)**